# දේශජ විසඳුම පඬුඅබා විසඳුමකි

බලය බෙදීම යනු ඇති ප්‍රශ්නයකට ගෙනෙන දේශජ විසඳුමක් නොව නැති ප්‍රශ්නයකට ගෙනෙන විදේශීය (ඉන්දීය හා බටහිර) විසඳුමකි. අපට අවශ්‍ය වන්නේ ඇති ප්‍රශ්නය කුමක්දැයි තේරුම් ගෙන එයට දේශජ විසඳුමක් ගෙන ඒමට ය. එහෙත් එයට පළමුව කළ යුතු දෑ බොහෝ වෙයි. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් බලය බෙදන්නේ ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයකට ඇති විසඳුම ඒ යැයි ගනිමිනි. ජනවාර්ගික ප්‍රශ්නය ලෙස පඬියන් දකින්නේ දෙමළ ජනයාට සිදු වී ඇතැයි කියන ඊනියා අසාධාරණකම් ය. එහෙත් දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදු වී ඇති අසාධාරණකම් කවරේ දැයි ප්‍රශ්න කළ විට පඬියන්ට දිය හැකි පිළිතුරක් නැත. පසුගිය දා දි අයිලන්ඩ් පුවත්පතේ කර්තෘට ලිපියක් සැපයූ ආචාර්ය එච් එල් සෙනෙවිරත්නට අනුව දෙමළ ජනයාට මෙරට තැනක් නැත. ඔවුහු මෙරට විගලිත ව සිටිති. එනම් දේශපාලන බලයක් නොමැති ඔවුහු රටේ පාලන කටයුතුවලට සහභාගි නො වෙති. බලය බෙදන්නේ ඔවුන් දේශපාලන කටයුතුවලට මැදිහත්කරවීමට ය.

එහෙත් මෙහි දී ප්‍රශ්න කිහිපයක් ම ඇසිය හැකි ය. දහනවවැනි සියවසේ හා විසිවැනි සියවසේ මුල් කාර්තුවෙහි මෙරට පාලන බලයක් නැතිව සිටියෝ කවරහු ද? එකල තිබුණේ ඉංගිරිසින්ගේ අධිරාජ්‍යවාදී පාලනයක් බව සැබෑ ය. එහෙත් ඒ පාලනයෙහි වුව ද යම් ව්‍යවස්ථාදායක කටයුතුවලට සහභාගිවීමට හැකි පිරිසක් මෙරට වූහ. ඉන් ප්‍රධාන වූයේ ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා ය. ඉන්පසු බර්ගර්වරු ද එයටත් පසුව ඉංගිරිසි උගත් සිංහලයෝ ද වූහ. මේ සියල්ලෝ ම ආගමින් කෙසේ වෙතත් සංස්කෘතියෙන් ඇංගලෝ සැක්සන් ක්‍රිස්තියානි වූහ. ඉංගිරිසි උගත් සිංහලයන් මේ ධුරාවලියෙහි පළමු තැනට පැමිණීම ඇරඹුණේ 1931 ලංකාවට සර්වජන ඡන්දය ලැබීමෙන් පසුව ය. බ්‍රිතානීන්ගේ පැත්තෙන් බැලූ කල ඔවුන් කළ ප්‍රධාන ම වරද වූයේ ලංකාවට සර්වජන ඡන්දය ලබාදීම ය.

බර්ගර්වරුන් ද විශේෂයෙන් ම ඉංගිරිසි උගත් දෙමළ ජනයා ද මධ්‍යයෙහි දේශපාලන වේදිකාවෙන් ක්‍රමයෙන් ඉවත්වූයේ ඉන්පසුව ය. එසේ ඉවත්වීමට සිදුවූයේ එතෙක් දශක ගණනාවක් තිස්සේ ඔවුන් ගෙන ගිය සිංහල විරෝධී දෙමළ ජාතිවාදී දේශපාලනය හේතුකොටගෙන ය. ඔවුන්ට විශේෂයෙන් ම ඉංගිරිසි උගත් දෙමළ ජනයාට අවශ්‍ය වී තිබුණේ මධ්‍යයෙහි (ව්‍යවස්ථාදායකයෙහි) සිංහල නායකයන් පරදවා ඉංගිරිසින්ගේ සහායෙන් මුළු රටේ ම නායකයන් වීමට ය. ඉංගිරිසීන් හා එක්ව ඔවුහු මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමි කිරීමට කටයුතු කළහ. ඉංගිරිසි උගත් සිංහල නායකයන් බොහෝ දෙනකුට ද සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන දීමට අවශ්‍ය නොවී ය. එහෙත් ඒ ඇතැමුන් ආගමින් බෞද්ධයන් වීම නිසා සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ වෙනසක් පෙනිණි. එහෙත් ඒ ව්‍යාජයක් බව අද වන විට සාමාන්‍ය සිංහලයන්ගෙන් යම් ප්‍රමාණයකට අවබෝධ වී ඇත. ඉංගිරිසිහු ඉතා සටකපට ලෙස සංස්කෘතියෙන් බටහිර යුදෙව් ක්‍රිස්තියානිවුවන් පිරිසක් සිංහලයන්ට නායකයන් ලෙස හඳුන්වාදීමට වගබලාගත්හ. අනෙක් පැත්තෙන් ඔවුහු ඉංගිරිසි උගත් දෙමළ ජනයා සිංහලත්වයට එරෙහිව මෙහෙයවූහ.

එදත් අදත් ඉංගිරිසිහු සිංහල බෞද්ධ සංස්කෘතියට විරුද්ධ වෙති. ඇතැමුන් සිතන අයුරින් ඉංගිරිසින් හා අනෙක් බටහිරයන් සිංහලයන්ට විරුද්ධවන්නේ සිංහලයන්ගෙන් දෙමළ ජනයාට අසාධාරණයක් සිදු වී ඇති නිසාත් ඒ රටවල වාසය කරන දෙමළ ජනයාගේ ඡන්දය තමන්ට ලබාගැනීම සඳහාත් ය. තවත් අයට අනුව බටහිරයන්ට ලංකාව යුද්ධය සම්බන්ධයෙන් ගත්කල මර්මස්ථානයක් වෙයි. එමෙන් ම ඔවුන්ට අනුව ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් වූ ස්වාභාවික සම්පත් ද දිගින් දිගටම තමන්ට නතුව තබාගැනීමේ අවශ්‍යතාව බටහිරයන්ට වෙයි. බටහිරයන් ඊළමක් ඔස්සේ ඊනියා දෙමළ ප්‍රාන්තවලට රට බෙදා එමගින් මර්මස්ථාන හා ස්වාභාවික සම්පත් පාලනය කිරීමට උත්සාහ දරණ බව මේ දෙවැනි කොටසේ නිගමනය වෙයි. පළමු මතය නිවැරදි නොවන්නේ බටහිරයන් තම රටවල පමණක් නොව ලෝකයේ ම පවත්වාගෙන යන ආකාරයේ සංස්කෘතික ආධිපත්‍යයක් සිංහලයන් කිසිම දවසක දෙමළ හෝ වෙනත් ජනවර්ගයක් මත හෝ පටවා නොමැති බැවිනි. උතුරේ ලක්‍ෂ තුනක පමණ දෙමළ ජනකායක් දෛනිකව නඩත්තු කිරීම පහසු කාර්යයක් නො වේ. ආණ්ඩුව මෙන් ම සිංහල ජනයා ද ඒ කාර්යයට මැදිගත් වෙති. ලෝකයේ කිසිම තැනක එවැනි කඳවුරු පවත්වා නොමැති බව අන් අයට වඩා හොඳින් බටහිරයෝ දනිති. එහෙත් ඔවුහු ඒ විවේචනය කරති. දෙමළ ජාතිවාදීන් හා ඔවුන්ට සහාය දෙන බටහිර දේශපාලනඥයන් උහතුන් ඒ කඳවුරු නාසි කඳවුරු සමග සංසන්දනය කරද්දී බටහිර ආණ්ඩු මුනිවත රකිමින් ඒ අනුමත කරයි. දෙමළ ජනයාට ලෝකයේ ම වඩාත්ම වරප්‍රසාද ඇති රට ලංකාව ය. තමිල්නාඩුවේවත් නැති අන්දමින් ලංකාවේ දෙමළ මාධ්‍යයෙන් ආචාර්ය

© Prof. Nalin De Silva

උපාධියක් පවා ලබාගත හැකි ය. කොළඹ කොටුව දුම්රියපොළේ දෙමළෙන් නිවේදනය කළ ද දිල්ලියේ දුම්රියපොළක එසේ නො කෙරෙයි. ජාත්‍යන්තර ගුවන්සේවයක දෙමළ යොදාගැනෙන්නේ ලංකාවේ මිස ඉන්දියාවේ නො වේ. සිංහලයන්ට විරුද්ධව සටන්කළ කරුණා අම්මාන් වැන්නකුට ඇමති පදවියක් ලබාදී ඇති රටක දෙමළ ජනයා අද කොන් වී ඇතැයි කියන්නේ කෙසේ ද? බටහිර රටවල දෙමළ ජනයාගේ ඡන්දය බලාපොරොත්තුවෙන් බටහිරයන් සිංහලයන්ට විරුද්ධවන්නේ යැයි කීම ළාමක ප්‍රතිචාරයක් පමණකි. කෝටි ගණන් වෙසෙන රටවල්වල ලක්ෂ තුන හතරක් යනු නොගිණිය හැකි ප්‍රමාණයකි.

මර්මස්ථාන හා ස්වාභාවික සම්පත් ගැන දොඩවන්නෝ තවමත් දහනවවැනි සියවසේ ජීවත්වෙති. මාක්ස්වාදී මුල් පොතපත නොකියවා අතනින් මෙතනින් අහුළාගත් ආර්ථිකවාදී ප්‍රවාද ඇසුරෙන් ඔවුහු මේ කතා කියති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පළමු භාගයේ ධනපති ක්‍රමය වර්ධනයවෙද්දී මර්මස්ථාන ස්වාභාවික සම්පත් ආදී කතා වලංගු වූ නමුත් අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සිය පැවැත්ම සඳහා කටයුතු කරද්දී ඒ කතා වලංගු නො වේ. අද ඇති තාක්ෂණය සමග මර්මස්ථානවලට තිබුණු තැන නැතිවී ඇත. ලංකාවේ ඇති ස්වාභාවික සම්පත් ලබාගැනීමට බටහිරයන්ට වෙනම රාජ්‍යයක් හෝ සන්ධීය රාජ්‍යයක් හෝ අවශ්‍ය නොවේ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පැවැත්මට ප්‍රධාන වශයෙන් තර්ජන එල්ලවන්නේ ඉස්ලාම් දේශපාලනයෙන් හා චීන ආර්ථිකයෙනි. තුන්වැනුව සිංහල බෞද්ධ සංස්කෘතියෙනි. බටහිරයෝ  මෙරට මෙන් ම පිටරට ද දැනුම තම අවශ්‍යතා අනුව පමණක් තම සංස්කෘතියට අවශෝෂණයකර යොදාගැනීමට අදහස් කරති. ඒ අතර තම පැවැත්ම වෙනුවෙන් මුස්ලිමුන්ට, චීනුන්ට හා සිංහලයන්ට එරෙහිව කටයුතු කරති. දහනවවැනි සියවසේ වුව ද බ්‍රිතාන්‍යයෝ දැනුවත්ව ම සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව ඒ නැතිකිරීමට හෝ දුර්වල කිරීමට හෝ කටයුතු කළහ. සිංහලත්වයට එරෙහිව ඉංගිරිසි උගත් දෙමළ ජනයා මෙහෙයවූ බ්‍රිතාන්‍යයෝ පසුව චෙල්වනායගම් යටතේ ඉංගිරිසි නූගත් දෙමළ ජනයා සිංහල විරෝධී ව්‍යාපාරයට එකතුකිරීමට අනුග්‍රහය දැක්වූහ. ඉන්පසුව ඔවුහු මුදලින් හා ප්‍රචාරයෙන්  ප්‍රභාකරන් පෝෂණය කළහ. අද ප්‍රභාකරන් වීරෝදාර හමුදා විසින් ඝාතනය කෙරී ඇති අතර ඉංගිරිසි නූගත් දෙමළ ජනයා සිංහලයන් සමග සහජීවනයෙන් කටයුතු කිරීමට පෙළඹෙති. සිංහලයෝ ද ඒ දෙමළ ජනයාට හැකි පමණින් ආධාර කරති. අද අවශ්‍ය වී ඇත්තේ අවුරුදු දෙදහසකට වඩා පැරණි සිංහල ජාතියට දෙමළ මුස්ලිම් හා අනෙක් ජනවර්ග එකතුකරගැනීම ය.

ශිෂ්‍ය ව්‍යාපාරයේ කර උඩින් ගොස්, පසුව ඇමතිවරුන් වූ ඊනියා ලිබරල් මහාචාර්යවරුන්ට කුළියට වැඩකර, අද වෙනත් ඇමතිවරු පසුපස ගොස් පඬියන් සේ වැජඹීමට තැත්කරන්නන්ට ජාතිය හා ජනවර්ගය ආදිය ගැන වැටහීමක් නැත. බ්‍රිතාන්‍යයින් තැත්කෙළේ මෙරට ජාතීන් දෙකක් වසන බව එත්තුගැන්වීමට ය. අර පඬියෝ ද දෙමළ ජාතිවාදීහු ද ඒ පිළිගනිති. අවසානයේ දී ප්‍රභාකරන්ගේ තිම්පු කොන්දේසි පදනම් වූයේ ද දෙමළ යනු වෙනම ජාතියක් ය යන්න මත ය. මාක්ස්වාදීන්ට ජාතිය ගැන මෙළෝ හසරක දැනුමක් නැති බව අප කියා ඇත්තේ අද ඊයේ නො වේ. ලිබරල්වාදීන්ට ද පොදුවේ බටහිර උගතුන්ට ද ජාතිය යන්න ජාතික රාජ්‍යය යන්න සමග තේරුම්ගත යුතු සංකල්පයකි. අවුරුදු දෙදහස් ගණනකට පෙර ජාතියක් ගොඩනැගූ සිංහලයන්ට වඩා හොඳින් ජාතිය යන්න තේරුම් ගත හැක්කේ කාහට ද? මෙරට ඇත්තේ එක් ජාතියක් පමණක් බවත් අනෙක් ජනයා ජනවර්ගවලට අයත් බවත් අපි සංකල්පීය නිරවුල්බවක් සහිත ව කියමු. අද ජාතිය ගොඩනැගීමක් ගැන කතා අවශ්‍ය නොවේ. එයට හේතුව දැනටමත් ජාතියක් තිබීම ය. අද කතාකළ යුත්තේ ජාතියක් ගොඩනැගීමට නොව ජනවර්ග ද එකතුකර ජාතිය පළල්කිරීමට ය. එහි දී ජනවර්ග පදනමක් මත බලය බෙදීමක් අවශ්‍ය නො වේ. එසේ කිරීමෙන් සිදුවන්නේ ජාතිය පළල්කිරීමක් නොව ජාතිය හා ජනවර්ග දුරස්ථවීම ය. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පවත්නා ආකාරයෙන් තබාගෙන ජාතිය පළල්කළ හැකි නො වේ. එපමණක් නොවේ. ඒ පදනම් වූ ඉන්දු ලංකා ගිවිසුම අහෝසිකිරීමට ද ලංකාණ්ඩුව ඉන්දීය ආණ්ඩුව සමග සාකච්ඡා ආරම්භ කළ යුතු ය. අද පවතින්නේ එදා පැවති සන්දර්භය නොවේ. අද කොටි පරාජය කෙරී ඇති අතර ඊනියා නිජභූමි කතා සංකල්පීයව පරාජය කෙරී ඇත. ප්‍රභාකරන් පමණක් නොව ජේ ආර් රජිව් ගාන්ධි දික්සිත් ගාමිණී දිසානායක ආදීන් ද ජීවතුන් අතර නැත. 1987 දී ඉන්දු ලංකා ගිවිසුම සම්බන්ධ කරුණකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගිය මට දශක දෙකකට අධික කාලයක් තිස්සේ අප ඉදිරිපත් කළ මත සනාථ වීම ගැන ඇත්තේ සතුටකි. අවශ්‍ය වන්නේ බලය බෙදීමක් නොව පඬුඅබා විසඳුමක් යැයි නැවතත් කියමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva